

# නැණ


CED ත්‍රෛමාසික පුවත් සඟරාව

CED Sri Lanka

Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව කලාපය 2025 අගෝස්තු


## කෘත්‍රිම බුද්ධියේ භාවිතයන්

වර්තමානය වන විට ලෝකයේ ප්‍රධාන හැරවුම් ලක්ෂය බවට පත්ව ඇත්තේ කෘත්‍රිම බුද්ධියේ භාවිතයන්ය. ඉතාමත් වේගයෙන් වර්ධනය වන තාක්ෂණයක් හා සෑම ක්ෂේත්‍රයක ම විහිදී ඇති මෙම කෘත්‍රිම බුද්ධියේ විකාශනය හා පරිණාමය ඉතා සංකීර්ණ එකක් බවට පත්ව තිබේ. කෘත්‍රිම බුද්ධියේ විකාශනය තුළ, විවිධ සංකල්පයන් හා නිමැවුම් බිහිවීම සහ පැවති සංකල්ප සහ නිමැවුම් ක්‍රියාවලිය නතරවීම ද සිදුවේ. වර්තමානය වන විට වඩාත් ජනප්‍රිය වෙමින් පවතින කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence), රොබෝ තාක්ෂණය, බුද්ධිමය ස්වයංක්‍රීයකරණය (Intelligence Automation) යන තාක්ෂණයන්ගේ විකාශනය තුළ අනාගතය තීරණය කරන්නක් වේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද කෘත්‍රිම බුද්ධියේ භාවිතාවන් මගින් වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටලුකාරී තත්ත්වයන් විසදාලමින් සැමට ගුණාත්මක, තිරසාර අධ්‍යාපන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා පිටිවහලක් වනු ඇත.

පරිගණක ලොවට හඳුන්වා දුන් මුල් අවධියේ සිට කෘත්‍රිම බුද්ධිය පිළිබඳ අදහසක් පරිගණක විද්‍යාඥයින් සතුව තිබිණි.

3 වන පිටුවට

### ඇතුළත


ඔබේ දැනුම සඳහා අධ්‍යාපන සංකල්ප පහක් — 5

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualification Framework – SLQF) — 6

The Importance of Education in Emergencies for Eliminating the Dependency Mindset — 7-10

යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සාකච්ඡාවට භාජනයවන, විශේෂයෙන් අගය කළ යුතු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳ විමසා බැලීම — 11

## අපේ දැක්ම

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

## අපේ මෙහෙවර

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

## අපගේ අරමුණු

1. සෑමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරීම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

### Summary Statistics of Government Schools by Teaching Staff - 2023

| Category | Total Teaching Staff | % of Total | Male | Male % | Female | Female % |
|---|---|---|---|---|---|---|
| **All Govt. Schools** | **237,787** | | **56,570** | **23.8** | **181,217** | **76.2** |
| **Level of School** | | | | | | |
| National Schools | 43,300 | 18.2 | 11,062 | 25.5 | 32,238 | 74.5 |
| Provincial Schools | 194,487 | 81.8 | 45,508 | 23.4 | 148,979 | 76.6 |
| **Type of School** | | | | | | |
| 1AB Schools | 80,457 | 33.8 | 21,232 | 26.4 | 59,225 | 73.6 |
| 1C Schools | 65,064 | 27.4 | 15,790 | 24.3 | 49,274 | 75.7 |
| Type 2 Schools | 57,899 | 24.3 | 13,253 | 22.9 | 44,646 | 77.1 |
| Type 3 Schools | 34,367 | 14.5 | 6,295 | 18.3 | 28,072 | 81.7 |
| **School by Gender of the School** | | | | | | |
| Boys Schools | 12,477 | 5.2 | 3,658 | 29.3 | 8,819 | 70.7 |
| Girls Schools | 18,187 | 7.6 | 2,605 | 14.3 | 15,582 | 85.7 |
| Mixed Schools | 207,123 | 87.1 | 50,307 | 24.3 | 156,816 | 75.7 |
| **Ethnicity of the School Established** | | | | | | |
| Sinhala Schools | 171,070 | 71.9 | 36,838 | 21.5 | 134,232 | 78.5 |
| Tamil Schools | 41,511 | 17.5 | 12,299 | 29.6 | 29,212 | 70.4 |
| Muslim Schools | 25,206 | 10.6 | 7,433 | 29.5 | 17,773 | 70.5 |
| **Plantation Estate Schools** | | | | | | |
| Outside the estate | 1,412 | 0.6 | 354 | 25.1 | 1,058 | 74.9 |
| Inside the estate | 12,809 | 5.2 | 3,700 | 28.9 | 9,109 | 71.1 |

| Category | Total Teaching Staff | % of Total | Male | Male % | Female | Female % |
|---|---|---|---|---|---|---|
| **Language Medim of the Appoitment of the Teaching Staff** | | | | | | |
| Sinhala Medium | 149,681 | 62.9 | 33,720 | 22.5 | 115,961 | 77.5 |
| Tamil Medium | 59,963 | 25.2 | 18,198 | 30.3 | 41,765 | 69.7 |
| English Medium | 8,470 | 3.6 | 1,383 | 16.3 | 7,087 | 83.7 |
| No Medium** | 19,673 | 8.3 | 3,269 | 16.6 | 16,404 | 83.4 |
| **School by Local Government Area** | | | | | | |
| MC Area | 34,642 | 14.6 | 7,273 | 21.0 | 27,369 | 79.0 |
| UC Area | 19,170 | 8.1 | 4,114 | 21.5 | 15,056 | 78.5 |
| PS Area | 183,975 | 77.4 | 45,183 | 24.6 | 138,792 | 75.4 |
| **Teaching Staff by Qualification Classification** | | | | | | |
| Graduate Trained | 101,261 | 42.6 | 25,906 | 25.6 | 75,355 | 74.4 |
| Graduate | 37,795 | 15.9 | 9,278 | 24.5 | 28,517 | 75.5 |
| Trained | 93,929 | 39.5 | 20,466 | 21.8 | 73,463 | 78.2 |
| Untrained | 4,458 | 1.9 | 850 | 19.1 | 3,608 | 80.9 |
| Other | 344 | 0.1 | 70 | 20.3 | 274 | 79.7 |
| **Section of the Teaching of Major Subject/ Major Activity** | | | | | | |
| Primary (1-5) Grades | 70,612 | 29.7 | 8,847 | 12.5 | 61,765 | 87.5 |
| Secondary (6-11) Grades | 112,555 | 47.3 | 27,201 | 24.2 | 85,354 | 75.8 |
| A/L (12-13) Grades | 33,138 | 13.9 | 10,503 | 31.7 | 22,635 | 68.3 |
| No Specific Section* | 21,482 | 9.0 | 10,019 | 46.6 | 11,463 | 53.4 |

No Specific Section* - Academic staff involving in Administration and management activities and other activies such as Office works, Library, ICT lab, Student Councilling, Sports activities and Special education and etc.,

No Medium** - Teacher who are appointment as English (Primary English, Secondary English, English Litrerature, A/L English and A/L General English) and Other foreign language teachers are considered as No medium

Source : School Census 2023 (2024)

*Prepared by Statistics Branch of MOE*

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

නො. 17, ධර්මපාල මාවත, රාජගිරිය.

**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**

කේ. ඩී. පීරිස් මහතා, වජිර උමගලිය මහතා, මහින්ද සිල්වා මහතා, එම්. ඒ. ජේ. රියාස් මහතා, එස්. පී. මෝහන් මහතා

## 1 වන පිටුවෙන්

ජෝන් මැකාති (John McCarthy) හෙවත් කෘත්‍රිම බුද්ධියේ පියා ගේ අර්ථකතනයට අනුව කෘත්‍රිම බුද්ධිය යනු "බුද්ධිමත් යන්ත්‍ර නිර්මාණය කිරීමේ විද්‍යාව සහ ඉංජිනේරු ක්‍රියාවලියකි"(1950). යනුවෙන් පවසන ලද්දේ එයින් පසුව විද්‍යාඥ ඇලන් ටියුරින් විසින් 1950 වර්ෂයේ දී ටියුරින් පරීක්ෂාව හඳුන්වා දෙන ලද අතර එමගින් යම්කිසි පරිගණක වැඩසටහනක බුද්ධිමත් භාවය මනිනු ලබයි. කෙසේ වෙතත් වර්තමානය වන විට විශ්ලේෂණාත්මක,කළමණාකරණ, සැලසුම්, සහ යම් යම් අරමුණු වෙනුවෙන් මෙම කෘත්‍රිම බුද්ධිය භාවිතා කරනු ලබයි. එමෙන්ම, සෞඛ්‍යාරක්ෂණය, මූල්‍ය කළමණාකරණය, අලෙවිකරණය, නිෂ්පාදන ක්ෂේත්‍රය සහ දැන්වීම්කරණය වැනි ක්ෂේත්‍රයන්ට පමණක් නොව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් මෙම කෘත්‍රිම බුද්ධිය භාවිතා වන බව දැකිය හැකියි. කෙසේ වෙතත් මේ වන විට කෘත්‍රිම බුද්ධිය යනු බොහෝ ක්ෂේත්‍ර ආක්‍රමණය කරඇති මිනිස් ශ්‍රමය මගින් සිදු කරන බොහෝමයක් වූ වැඩ සහ රාජකාරි ඉටු කරන වැඩ පහසු කරන ක්‍රමවේදයක් බවට පත්ව ඇත.

### කෘත්‍රිම බුද්ධිය හා අධ්‍යාපනය

කෘත්‍රිම බුද්ධිය හරහා අධ්‍යාපනයේ සිදු වූ නව පිබිදීම මගින් නව ක්‍රම භාවිතා වන අතර, ඉගැන්වීමේ සහ ඉගෙනුම් ක්‍රියාවලීන් දෙකම වඩාත් පහසුවෙන් හා ඵලදායීව සිදු කල හැකිවේ. සිසුන්ගේ කාර්ය සාධනය විශ්ලේෂණය කිරීමෙන් සහ පුද්ගල අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පාඩම් සකස් කිරීමෙන්, මන්දගාමී ඉගෙන ගන්නන්ට ඒවා ලබා ගැනීමට සහ දක්ෂ සිසුන්ට කාර්යක්ෂම අධ්‍යාපන ක්‍රමයක් වෙත ප්‍රවේශවීමට අවස්ථාව හිමිවනු ඇත. සිසුන්ගේ ශක්තීන් සහ දුර්වලතා ඉස්මතු කරන ස්වයංක්‍රීය ශ්‍රේණිගත කිරීම, ස්මාර්ට් පාඩම් සැලසුම් කිරීම සහ දත්ත විශ්ලේෂණය හරහා ගුරුවරුන්ට ප්‍රතිලාභ ලබාගත හැකි වේ.

භාෂා පරිවර්තනය, කථන සේවා සහ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඉගෙනුම් ආධාරක වැනි මෙවලම් ලබා දීමෙන් සියලුදෙනා ඇතුළත් අධ්‍යාපනයට ද කෘත්‍රිම බුද්ධිය සහාය වේ. නවීන අධ්‍යාපනයේ ප්‍රවේශතාව, කාර්යක්ෂමතාව සහ නියැලීම වැඩි දියුණු කිරීමට කෘත්‍රිම බුද්ධිය වැදගත් වේ.

### කෘත්‍රිම බුද්ධිය සහ ශ්‍රම වෙළඳපොළ අනාගතය

කෘත්‍රිම බුද්ධියේ ආගමනයත් සමග ශ්‍රම වෙළඳපොළ තුළ පැවැත්ම සහ මිනිස් ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම අඩු වීම හේතුවෙන් එය මිනිසාට කෙසේ බලපාන්නේ ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මෙහිදී ගොඩනැගෙන කතිකාව වන්නේ නැගී එන තාක්ෂණික ක්‍රමවේද හරහා පවත්නා රැකියා අහිමිවීමේ සම්භාවිතාව ඉහළ අගයක් ගැනීමයි. තාක්ෂණික ශක්‍යතාව, පිරිවැය කාර්යක්ෂයතාවය,යටිතල පහසුකම්වල සුලභතාවය යන සාධක මත කම්කරුවාට යම් ක්ෂේත්‍රයක් ස්වයංක්‍රීයකරණය තුළින් ඇතිවිය හැකි බලපෑම පදනම් වේ.

උදාහරණ ලෙස,

ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය සඳහා යොමුවීම බෙහෙවින් අඩුවීමේ ප්‍රතිපලයක් ලෙස කෘෂිකර්මාන්තයට අදාළ තාක්ෂණික ක්‍රමවේදයන් යොදාගැනීම හේතුවෙන් ඉහළ වානිජ වටිනාකමක් හිමිවීමට සහ අඩු මිනිස් ශ්‍රමයක් තුළින් වැඩි ඉපැයීමක් සිදු කිරීමට හැකිවනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය වශයෙන් කෘෂිකර්මාන්තයෙන් ජීවත් වන කම්කරු ප්‍රජාව සඳහා බලපෑමක් ඇතිවීමේ සම්භාවිතාව ඉහළ අගයක් ගනී. නමුත් ස්වයංක්‍රීය කරණය සිදුකළ නොහැකි කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි කම්කරු ශ්‍රමය හිඟවීම හේතුවෙන් ගැටළු උද්ගත වීමේ හැකියාවක් ද පවතී.

# Practical Advocacy Tools

## Research and Evidence Gathering

- Collect data on education disruption in emergencies - **Google Forms, SurveyMonkey, KoboToolbox**
- Document personal stories and testimonials

## Stakeholder Mapping

- Identify key decision-makers and influencers
- Analyze their interests, positions, and influence – **Miro, Mindmeister, Mural**

## Message Development

- Craft clear, compelling messages – **VN, Hootsuite, Filmic Pro, Canva, Audacity, Capcut**
- Tailor messages to specific audiences- **GPT, Gemini, Copilot**

| | |
|---|---|
| Camera FV5 | inShot |
| Photoshop Express | **KinMaster** |
| Firstlight | Poster Maker |
| Filmic Pro | GCam |
| VN Video Editor | LightRoom |
| Voice Notepad | **OpenCamera** |
| FilmoraGo | VSCO |
| ClipDrop | |
| Fyuse | |
| ProShot | |
| **Quick** | |
| Splice | |

## Communication Channels

- Traditional media: press releases, interviews
- Social media campaigns and digital storytelling – **FB, X, Instagram, Tiktok, Youtube**
- Community meetings and public events




ඉදිකිරීම් අංශ කෙරෙහි අවධානය යොමු කිරීමේදී ඉදිකිරීම් සඳහා ස්වයංක්‍රීයකරණය භාවිතා කිරීමේ හැකියාවක් පවතින අතර ඒ සඳහා වන ආයෝජන සඳහා විශාල මුදලක් වැයවීම වැනි කරුණු හේතුවෙන් ස්වයංක්‍රිය ක්‍රමවේදයන් සඳහා යොමුවීම මන්දගාමී වී තිබෙන බවක් දැකිය හැකිය.

ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ඉතාමත් ඉක්මනින් ස්වයංක්‍රීයකරණය සිදු වන ක්ෂේත්‍රයක් වනු ඇති බවට නිගමනය කළ හැකිය. නමුත් ඒ හරහා සිදුවන රැකියා අහිමිවීමට සාපේක්ෂව ඉල්ලුමට සාපේක්ෂව සිදුවිය යුතු භාණ්ඩ ප්‍රවාහන හා ගබඩා කිරීමේ පහසුකම් වර්ධනය කිරීම සඳහා ඉදිරි කාලය සඳහා නව රැකියා බිහිකිරීමට හැකි වනු ඇත. නමුත් අනාගතවාදීව බැලීම තුළින් පැහැදිලිවන කරුණ වන්නේ මෙම ක්ෂේත්‍රයන් තුළින් නිර්මාණය වන රැකියාවන් ප්‍රමාණය බෙහෙවින්ම අවම වන බවයි.

පරිගණක සහ දත්ත කළමණාකරණය වැනි ක්ෂේත්‍රයන්ට අදාළ රැකියා අවස්ථා පුළුල් වනු ඇත්තේ කෘත්‍රිම බුද්ධිය අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා කෙතරම් කාර්යක්ෂමව ක්‍රියාකලද අත්‍යවශ්‍යම දෙයක් වන සවිංඥානිකත්වය නොමැති වීමයි. එබැවින් අදාළ කෘත්‍රිම බුද්ධිය මෙහෙයවීම සඳහා මානව දායකත්වය අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර ඒ සඳහා පරිගණක සහ දත්ත හැසිරවීම සම්බන්ධයෙන් නව රැකියා වෙළඳපොළක් නිර්මාණය වනු ඇත.

රාජ්‍ය අංශයේ රැකියා සඳහා මෙම කෘත්‍රිම බුද්ධියේ බලපෑම අවම වීම සඳහා වන හේතු ලෙස,

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පුළුල් වීම,
- ඉලක්කගත ක්‍රියාමාර්ග අනුගමනය නොකරනු ඇතැයි උපකල්පනය කල හැකි වීම,
- නිළධාරීවාදය,
- විධිමත් අධ්‍යාපනික සහ ක්‍රමවත් පුහුණුවක අවශ්‍යතාවය පැවතියද ඒ සඳහා යොමුවනු ඇතැයි සිතිය නොහැකි වීම,
- තාක්ෂණය සම්බන්ධව පවතින ජනප්‍රිය මත සහ ඒ පිළිබඳව විශ්වාසයක් නොමැති වීම.

යනාදී කරුණු මත රාජ්‍ය සේවය සඳහා ස්වයංක්‍රීය ක්‍රමවේදය හඳුන්වා දීම එතරම් පහසු කටයුත්තක් නොවනු ඇත. මන්ද යත් විද්‍යුත් පාලන ක්‍රමෝපායයන් පිළිබඳ සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අධ්‍යාපනික සහ ක්‍රමවත් පුහුණුවක අවශ්‍යතාවය වැදගත් වන අතර එය මගින් සාර්ථක බාවය තීරණය වනු ඇත.

*නිර්මාණ හැකියාව සහිතව*
*මිනිසාට විචාර බුද්ධිය උරුම වී ඇත්තේ,*
*ඊට තවත් දේ එකතු කිරීමටය*
*එහෙත් ඔහු මේ තාක්*
*නිර්මානාත්මක වීම වෙනුවට*
*විනාශකාරී වී ඇත*
*මක්නිසාද යත්,*
*වනාන්තර වැනසෙයි*
*ගංගා සිදියයි*
*වනජිවීහු වැඳවෙති.*
*දේශගුණය අගුණ වේ*
*පොලොව දරිද්‍ර වී*
*දිනෙන් දින අවලස්සන වෙයි*

- ඇන්ටන් වෙකොෆ්
ලියා එව්වේ
කලාභූෂණ කේ.ඩී . පීරිස්

හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය සුරකිමු.






# ඔබේ දැනුම සඳහා අධ්‍යාපන සංකල්ප පහක්

අධ්‍යාපනයේ සංවර්ධනය වෙනුවෙන් කැපවෙන සැමට මෙහි සඳහන් අධ්‍යාපන සංකල්ප ගැන සංක්ෂිප්ත අවබෝධයක් හෝ ලැබීම ප්‍රයෝජනවත් විය හැකිය.

### 1. ඉගෙනුම් සමාජය (Learning Society)

සියලුම සාමාජිකයන්ගේ හැකියා හා ශක්තීන් උපරිම ලෙස සංවර්ධනය කර ගත හැකි ඕනෑම අවස්ථාවකි. සිරස් හෝ තිරස් අතර අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව සැලසෙන සමාජයකි. වර්තමානයේ ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන අධ්‍යාපනය හා සම්බන්ධ මෙන්ම වෙනත් විවිධාකාර ශාස්ත්‍රීය බහුජන සංවිධාන බොහෝමයක ඒකායන අධිෂ්ඨානයක් වන්නේ සියලුම ලෝකවාසීන් දැනුමෙන් සන්නද්ධ විය යුතු බවයි. ඒ වෙනුවෙන් සැම සමාජයක්ම ඉගෙනුම් සමාජයක් වියයුතු බව අවධාරණය කෙරේ.

### 2. සැමට අධ්‍යාපනය (Education for all)

ලෝවැසි සියලුම තරාතිරම්වල ජනතාවට අධ්‍යාපනය ලබා දීමයි. මෙහිදී ප්‍රාදේශීය බේද, පන්ති බේද, වයස් බේද, ජාති බේද, ලිංග බේද මෙන්ම ආබාධිත බව වැනි කරුණු ද, සැලකිල්ලට ගනු ලැබේ. ගෝලීය වශයෙන් මේ සඳහා ගෙන ඇති පියවර වන්නේ, 1948 දෙසැම්බර් 10 දින යුනෙස්කෝ ගිවිසුමට අනුව ලෝවැසි සැමට අධ්‍යාපනය දිය යුතු බව තීරණය විය. 1972 යුනෙස්කෝව මගින් පලකළ "දිවි පැවැත්ම සඳහා ඉගෙනුම" නම් වූ කොලිෂන් සභා වාර්තාවෙන් ද, ඉහත සංකල්පය තහවුරු කරන ලදී. 1990 වර්ෂයේ තායිලන්තයේ ජෝම්තියස් නගරයේ පවතී "සැමට අධ්‍යාපනය" නම් වූ සංකල්පයෙන් මෙම අදහස උද්දීපනය විය.

### 3. අධ්‍යාපන සම අවස්ථා (Equal Education opportunities)

ලොව සැම රටකම යම් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එය කුමක් වුවත් එහි අන්තර්ගත සියලු අයිතිවාසිකම්වල වරප්‍රසාද මෙන්ම පහසුකම් එම අධ්‍යාපනය ලබන විවිධ තරාතිරම්වල ප්‍රජාවට බොහෝදුරට එක සමාන අයුරින් ලැබිය යුතුය යන්න මින් අදහස් කෙරේ. රටක අධ්‍යාපනයේ සම අවස්ථා ඉටුවේදැයි අවස්ථා 04 කදී විමසා බැලිය හැකිය. එනම්,

- ප්‍රවේශ අවස්ථාව (Access)
- සාධන අවස්ථාව (Achievement)
- ප්‍රතිදාන අවස්ථාව (Output)
- ප්‍රතිඵල ලබන අවස්ථාව (Outcomes)

### 4. යාවජීව අධ්‍යාපනය (Life long learning)

පුද්ගලයෙකු ස්වකීය ජීවිත කාලය මුළුල්ලේම සෑම අතින්ම ලබන සියලුම ඉගෙනුම් අත්දැකීම් යාවජීව අධ්‍යාපනය නම් වේ. එසේ වුවද වර්තමානයේදී මෙම සංකල්පයෙන් ඉස්මතු වන්නේ ඉහත සඳහන් ඉගෙනුම් අවස්ථාවන් අරමුණු සහගතව සහ විධිමත් රටාවකට ගොඩ නැගිය යුතු බවයි. පුද්ගලයෙකු මව්කුස පිළිසිඳගත් දා සිට මියෙන තුරා ලබන්නා වූ දැනුම් සම්භාරය යාවජීව අධ්‍යාපනය වන බව ව්‍යවහාරයේ පවතී.

### 5. පූර්ණ අධ්‍යාපනය (Total education)

අධ්‍යාපන කාර්ය ප්‍රධාන අංශ 03කින් සමන්විතය. මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපන දර්ශනය අනුව එය මෙසේය.

- හිස (Head) සංවර්ධනය
- හිත (Heart) සංවර්ධනය
- අත (Hand) සංවර්ධනය

ඉහත කී අංශ 03 ම එකසේ සංවර්ධනය කෙරෙන අධ්‍යාපනය "පූර්ණ අධ්‍යාපනය" යි. අධ්‍යාපන විද්වතෙකු වූ ආචාර්ය බෙන්ජමින් බ්ලූම් ඉහත කී අංශ විග්‍රහ කරන්නේ මෙසේය.

- ප්‍රජානන ක්ෂේත්‍රය (Cognitive domain)
- ආවේදන ක්ෂේත්‍රය (Effective domain)
- මනෝචාලක ක්ෂේත්‍රය (Psychomotor domain) යනුවෙනි.


මෙය මහත්මා ගාන්ධිතුමාගේ විග්‍රහයට වඩා අර්ථවත් වුවද ඊට බෙහෙවින් සමානය. බ්ලූම්ගේ වර්ගීකරණය අනුව විග්‍රහ කර බැලුවිට ද පැහැදිලි වන්නේ ඉහත කී අංශ 03 ම එකසේ සංවර්ධනය වන අධ්‍යාපනය, පූර්ණ අධ්‍යාපනය වන බවයි.

**අධ්‍යාපනපති,**

**ඩබ්. විජේවන්ත වෙල්ලාල මහතා**



# ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව
# (Sri Lanka Qualification Framework – SLQF)




මෙය බොහෝ දෙනෙකුට තම අධ්‍යාපන සුදුසුකම් වර්ධනය කරගන්නට වැදගත් වේවි.

සාමාන්‍ය පෙළ/ උසස් පෙළ සමත් වූ අයෙකුට පියවරෙන් පියවර තම සුදුසුකම් ඉහළ නංවාගැනීමට අවස්ථාව හිමිවේ.

1. **සහතික පත්‍ර පාඨමාලාව** (Certificate Course) සාමාන්‍ය පෙළ සමත් වීමෙන් පසුව ඔබ කැමති ක්ෂේත්‍රයකින් සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරිය හැකිය. මෙහිදී රජය පිළිගත් ආයතනයකින් සිදු කිරීමට සැළකිලිමත් විය යුතුයි.
2. **උසස් සහතික පත්‍ර පාඨමාලාව** (Advanced certificate Course) සහතිකපත් පාඨමාලාවෙන් පසුව උසස් සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරිය හැකිය.
3. **ඩිප්ලෝමා පාඨමාලාව** (Diploma) ඔබ සහතිකපත් පාඨමාලාවක් කිරීමෙන් පසුව උසස් සහතික පත්‍ර පාඨමාලාව නොකළත් ඩිප්ලෝමා පාඨමාලාවක් කරන්න සුදුස්සෙක් බවට පත් වේ. ඔබ උසස් පෙළ සමත් අයෙක්නම් සහතික පත් පාඨමාලාවක් නොකර වුවත්, ඔබ කැමති අංශයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරිය හැකිය.
4. **උසස් ඩිප්ලෝමා පාඨමාලාව** (Higher Diploma) ඩිප්ලෝමා පාඨමාලාවක් කිරීමෙන් පසුව ඔබට උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් කරන්න සුදුසුකම් ලැබේ.
5. **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)** (Bachelor General). සාමාන්‍ය පෙළින් පසුව පිළිවෙළින් ලබාගත් උසස් ඩිප්ලෝමා පාඨමාලාවෙන් පසුව ඔබට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය හැදෑරිය හැකිය. ඔබ උසස් පෙළ සමත් නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින ඕනෑම විශ්වවිද්‍යාලයක බාහිර උපාධිය හැදෑරිය හැකිය. ඔබ විශ්ව විද්‍යාලයකට තේරී පත්වුවහොත් අනිවාර්යයෙන් සාමාන්‍ය හෝ ගෞරව උපාධිය හැදෑරිය හැකිය.
6. **ශාස්ත්‍රවේදී** (විශේෂ Special). ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (Bachelor Hons) යනුවෙන් මෙය හැඳින්වේ. මෙහි පහළ පෙළ පංති සාමාර්ථය, දෙවන පෙළ ඉහළ පංති සාමාර්ථය, පළමු පෙළ පංති සාමාර්ථය නැතහොත් ප්‍රථම පංති සාමාර්ථය ආදී වශයෙන් පංති සාමාර්ථ ලබාගත හැකිය. ගෞරව උපාධි හැදෑරීමට නම් ඔබ අනිවාර්යයෙන් විශ්වවිද්‍යාලයකට තේරී පත්විය යුතුයි.

   ඔබ සාමාන්‍ය හෝ ගෞරව උපාධිය ලබාගත් පසුව පහත පිළිවෙළ අනුව ඔබගේ පශ්චාත් උපාධි අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකිය.
7. **පශ්චාත් උපාධි** සහතිකපත්‍ර පාඨමාලාව (Post graduate Certificate) නැතහොත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (Post Graduate Diploma)
8. **ශාස්ත්‍රපති උපාධිය** (Master of Arts – MA) නැතහොත් සමාජීයවිද්‍යාපති උපාධිය (Master of Social Sciences – MSSC).
9. **දර්ශනපති උපාධිය** (Master of Philosophy – Mphil)
10. **දර්ශනශූරී උපාධිය** (Doctor of Philosophy), ආචාර්ය උපාධිය (PhD)

*ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualification Framework – SLQF) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව මගින් ඉදිරිපත් කරන ලද්දකි.*

# The Importance of Education in Emergencies for Eliminating the Dependency Mindset

**1. Introduction**

Emergencies—whether natural disasters, armed conflicts, pandemics, or economic crises—disrupt the normal functioning of societies. In such contexts, the education system often collapses, leaving children and communities vulnerable to a "dependency mindset." This mindset is characterized by reliance on external aid rather than building self-reliance and sustainable solutions.

Education plays a critical role in preventing and eliminating this dependency. By continuing learning even during crises, education nurtures resilience, independence, and problem-solving capabilities, enabling individuals and communities to rebuild their futures

**2. Understanding the Dependency Mindset**

The dependency mindset refers to a psychological and social state where individuals or communities rely excessively on external aid rather than developing internal capacities to solve their own problems.


Reducing self-confidence, lacking the problem-solving skills, and a passive attitude toward challenges at the individual level , hindered development, prolonged poverty cycles, and over-reliance on external assistance at the Community level and loss of innovation, self-sufficiency, and social cohesion as a long term are the main impacts which might cause as a result..

Emergencies often lead to School closures, destruction of educational infrastructure, and disruption of learning while Increasing risks of child labor, early marriages, exploitation, and recruitment into armed groups by causing Psychological trauma among children and youth, reducing motivation and mental stability.

According to UNESCO and INEE, millions of children affected by crises are deprived of education, further entrenching cycles of dependency and vulnerability.

**3. Education in Emergencies (EiE): Core Principles and Benefits**

Education in emergencies (EiE) involves ensuring that children and communities continue to learn despite crises. Key principles including protection & psychosocial support which provide a safe and structured environment to heal from trauma , academic continuity by Maintaining learning of basic literacy, numeracy, and life skills and resilience building by promoting adaptive capacities, peacebuilding, and social cohesion.




Reducing risks helps to Protect children from exploitation, early marriages, and violence by Supporting recovery with the help of the education which acts as a bridge to normalcy, helping communities to rebuild. It also Build human capital for economic recovery and sustainable growth which Fosters long-term development while Promoting innovation help to encourages creative thinking and problem-solving and countering dependency.

**4. The Link Between Education and the Elimination of Dependency Mindset**

Education breaks the dependency cycle by Developing agency and self-reliance by equipping individuals with the skills to take control of their lives while fostering critical thinking by encouraging innovation and problem-solving rather than passivity. Building community resilience helps empowering communities to respond to crises using local resources and knowledge.EiE initiatives also focus on community participation, teacher empowerment, and

psychosocial learning, which strengthen independence and confidence.

### 5. Global and Local Evidence

Research shows UNESCO's Global Education Monitoring Reports emphasize that education in crises is essential for achieving SDG 4 (Quality Education).CMDI studies in China reveal that disaster preparedness programs in schools increase students' self-protective behaviors and reduce dependency on external rescue. Examples from countries like Sri Lanka, Nepal, and Rwanda show how school-based emergency programs foster community-driven recovery.

Education equips communities with practical skills—e.g. disaster preparedness, first aid, vocational training, livelihood alternatives—that reduce long-term reliance on external aid. When people learn how to manage risks and rebuild, dependency diminishes. Structured learning fosters critical and adaptive thinking. Rather than waiting passively, people identify local solutions—repair damaged infrastructure, organize community savings groups, run small businesses. This shift transforms recipients into proactive agents. Schools and education programs in emergencies can foster community networks. Students, teachers, and parents collaborate on preparedness drills, disaster response teams, and reconstruction—all strengthening local ownership and collective agency. Continuing education amid crises provides stability and psychosocial healing, particularly for youth. It contributes to motivation and resilience countering fatalism or resignation that can accompany dependency.

5.1 Sri Lanka's Experience & Education in Emergencies

Due to Tsunami of 2004 over 35,000 Sri Lankans died; 182 schools destroyed and 287 repurposed as displacement camps—educational continuity collapsed overnight. Recurring floods & landslides, plus the 2020–2022 economic crisis and pandemic closures, severely disrupted schooling—highlighting education's vulnerability yet necessity. Concurrently, Sri Lanka has grappled with a broader cultural dependency mindset, where citizens come to expect government or external assistance without reciprocal effort. Critics note that decades of welfare-politics have nurtured a sense of entitlement over collective responsibility .

Education's Role in Shifting Mindsets

1. Disaster Risk Reduction (DRR) in School Curricula : Education initiatives now integrate tsunami preparedness and hazard awareness into the curriculum. Studies show that half of coastal schools lacked evacuation drills after 2004, underscoring the need for systematic preparedness in education .
2. Civil society & youth capacity-building around EiE: In early 2025, the Coalition for Educational Development (CED Sri Lanka) held youth workshops—training young leaders in flood-prone Ratnapura on INEE Minimum Standards, disaster preparedness, advocacy, and emergency response planning . Later, a wider Awareness Programme on Education in Emergencies emphasized inclusive systems and community role in disaster planning .
3. Thorough DRR trainings in schools: NGOs like A-PAD SL have delivered interactive Disaster Risk Reduction training for students across southern, Eastern, and Uva provinces, teaching thunder/lightning, flood, and heat-wave safety. These empower children as active participants in resilience-building .
4. Sarvodaya and community self-governance: Indigenous organizations like the Sarvodaya Shramadana Movement emphasize self-help and local reconstruction post-tsunami, encouraging beneficiaries to contribute labor and leadership in rebuilding rather than remain passive recipients—thus reinforcing agency and community ownership .

   Through these efforts, Sri Lanka is actively transforming from a model of crisis aid dependent on external actors to one grounded in local knowledge, youth leadership, and self-organizing resilience.

Mechanisms & Strategies in Sri Lanka

A. National & Institutional Integration

Curriculum reforms: Integrating DRR and emergency preparedness into Science, Geography, and life-skills syllabi ensures education systems anticipate and prepare for disasters—reducing external reliance.

School safety and infrastructure: Many schools in high-risk zones face structural damage. Efforts are underway to inspect and retrofit buildings, install early-warning systems, and embed evacuation planning into school management .

B. Civil Society & Youth Leadership

Programs run by groups like CED encourage youth to advocate for local Education-in-Emergencies (EiE) policies, bridging between communities and official disaster planning agencies .Local volunteer movements reinforce education through self-help rebuilding after disasters (e.g., Sarvodaya's post-tsunami reconstruction), teaching communities ownership of recovery tasks .

C. Utilization of Informal Learning & Peer Education

Peer-led disaster safety groups in schools—facilitated by trained students—help disseminate knowledge and build internal capacity so that safety procedures are maintained even when external support withdraws.

D. Hybrid & Distance Learning Innovations

During COVID-19, remote learning rolled out via TV, WhatsApp and social media—but accessibility was limited. Only 45% of students were reached; true interactive platforms reached only 4% .

While flawed, these initiatives created space to promote blended-hybrid learning strategies, encouraging student-centered learning and reducing reliance on centrally delivered “spoon-fed” lessons .

**6. Why Education in Emergencies Matters for Eliminating Dependency**

When people learn to prepare, cope, self-organize, and recover, they depend less on external donors. Instead of waiting for relief packages, they lead reconstruction and advocacy securing external support only in strategic, enabling roles. Sri Lanka’s traditional welfare programs (e.g. Samurdhi, Janasaviya) though needed, often foster dependency by awarding aid without building agency or reciprocal social bonds. Education in emergencies, however, builds skills and community ties rather than mere consumption of benefits.

Education-centered community recovery restores social trust: youth, parents, teachers, local leaders collaborate. This revives Sri Lanka’s traditional ethics of collective responsibility, counterbalancing transactional political patronage systems .Robust emergency education normalizes preparedness, drumming capacity into systems—not just individuals. Communities equipped with skills, networks, and critical thinking stand better equipped when future crises strike. Formal education—during or after crises—stuffers hopelessness and idleness. Schools offer structure and hope; learning encourages future orientation. This counters dependency’s emotional and mental side, reinforcing self-worth and ambition.

**7. Challenges & Recommendations for Sri Lanka**

1. Infrastructure gaps: Many schools, particularly in rural and coastal zones, lack safe buildings, warning systems, or evacuation plans. Damage from landslides and earth slips continues to expose students to risks .

2. Access disparities: Remote households lacked internet or devices during COVID-19 closures; access remains uneven, especially among disadvantaged communities .

3. Cultural inertia: Deep-rooted dependency attitudes—reinforced by political welfare—impede shifts toward self-reliance .

4. Fragmented leadership & coordination: Multiple agencies, civil-society groups, and education authorities often act in silos without integrated EiE strategies.

5. Limited monitoring & knowledge systems: Schools and communities lack systematic data on learning loss, dropout risk, and disaster preparedness.

Strategic Recommendations

To eliminate dependency mindset through education in emergencies education should be recognized as the fourth pillar of humanitarian response (alongside food, water, and shelter) while securing sustainable funding for EiE programs by incorporating resilience-based curricula that teach problem-solving and self-reliance and enhancing community-driven education initiatives rather than donor-driven approaches.

- Policy & System Strengthening : Embed Education in Emergencies (EiE) and Disaster Risk Reduction (DRR) into national education policy and planning. Mandate safety standards, evacuation drills, and early-warning systems in school regulations and accreditation.
- Capacity Building & Community Ownership: Train teachers, school leaders, and youth leaders in INEE minimum standards and emergency pedagogies (as CED has started) .Promote community-led school governance committees to oversee safety and resilience planning.
- Infrastructure Upgrades: Prioritize retrofitting school buildings in hazard-prone districts. Establish systematic hazard audits and maintenance schedules grounded in disaster preparedness.
- Inclusive Access & Hybrid Learning: Expand low-tech and offline learning alternatives (radio, community learning hubs) in connectivity-poor areas. Design blended learning curricula emphasizing active learning and student agency.
- Monitoring, Data & Research: Systematically assess learning recovery post-disruptions, track dropouts, and gather feedback from communities. Share good practices and explore ongoing research partnerships (e.g. tsunami preparedness studies) .
- Culture Change & Citizenship Education: Bake civic, ethical, and participatory citizenship modules

into education—teaching reciprocity, self-help, and responsibility. Highlight historical traditions (e.g., tank-village cooperation, Sangha support systems) as heritage models of collective action and agency .

**8. Conclusion**

Education in emergencies is far more than a stopgap—it is a transformation engine. In Sri Lanka, reinforcing education capacity during crises like the tsunami, floods, pandemics, or economic shock can fundamentally shift mindsets away from dependency toward resilience, agency, and collective ownership. Empowered youth, prepared schools, active communities, and policy institutions together form a durable foundation—so that when disaster strikes, Sri Lankans respond not as passive aid recipients but as informed, organized, responsible actors.

This systemic move from reliance toward self-reliance is not automatic. It demands sustained policy commitment, infrastructure investment, civil-society collaboration, and culture change. But Sri Lanka is already laying down the pieces. With continued momentum, education in emergencies can become a national bridge: connecting crisis response to transformative development, and ending the cycle of dependency once and for all.

MANEESHA BANDARANAYAKE

EIE youth Team

# හදිසි අවස්ථා තුළ අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා වූ තරුණ ධාරිතා සංවර්ධන වැඩසටහන







2025 වසර සඳහා හදිසි අවස්ථා තුල අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා වූ තරුණ වැඩසටහන් 02ක් අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් සංවිධානය කර තිබුණි. පසුගිය පෙබරවාරි මාසයේ දී වැඩි වශයෙන් ආපදා තත්ත්වයන්ට මුණ දෙන සබරගමු පළාතෙහි මෙහි පළමු වැඩසටහන පවත්වන ලදී. මෙහිදී INEE STANDANDS හා උද්දේශන ක්‍රමවේද පිළිබඳ අවධානය යොමු කරන ලදී. මෙහිදී අප සාමාජික සංවිධානයන් හරහා මෙම තරුණ පිරිස සම්බන්ධ කරගත් අතර අති සාර්ථක අන්දමින් ආපදා තත්ත්වයකදී වුවත් අධ්‍යාපන තහවුරු කිරීම පිළිබද උද්දේශන කටයුතු සිදු කරන ලදී. එමගින් අප බලාපොරොත්තු වූ ශක්තිමත් නායකත්වයෙන් අනුන තරුණ පිරිසක් නිර්මාණය කිරීමට අවශ්‍ය අඩිතාලම සකස් කිරීමට අධ්‍යාපන සංවර්ධන සන්ධානය සහභාගිවිය.

මෙහි දෙවන වැඩසටහන ජාතික මට්ටමින් දිස්ත්‍රික් සාමාජික සංවිධාන තරුණ පිරිස නියෝජනය කරමින් පවත්වන ලදී. මෙහිදී උද්දේශන ක්‍රමවේද සඳහා සමාජ මාධ්‍ය භාවිතය හා පුවත්පත් ලිපි සම්බන්ධයෙන් අවධානය යොමු විය. මෙහිදී ද දිස්ත්‍රික් මට්ටමින් හදිසි අවස්තාවන් තුල අධ්‍යාපනයට සිදු වන බලපෑම ඔවුන් විසින් විස්තර කල අතර ඒ සඳහා සමාජ මාධ්‍යයා උද්දේශන සඳහා යොදා ගැනීම පිළිබද අවධානය යොමුකරන ලදී.






# යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සාකච්ඡාවට භාජනයවන, විශේෂයෙන් අගය කළ යුතු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳ විමසා බැලීම




නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ මේ වනවිට අප සමාජය තුළ විවිධ සාකච්ඡා සිදුවෙමින් පවතී. එසේ සාකච්ඡාවට බඳුන් වන වඩාත් විශේෂ වන හා අගය කළහැකි කරුණු කිහිපයක් සාකච්ඡාවට යොමු කිරීම මෙම ලිපියේ අරමුණ වේ. එවැනි එක් කරුණක් වන්නේ අපේ පාසල් පද්ධතිය තුළ සිදුකිරීමට අපේක්ෂිත පරිවර්තනය යි.

වර්තමාන ශ්‍රී ලංකාවේ තිබෙන පාසල් 10096 (2023) න් බොහොමයක් ගම්බද පාසල් වන අතර ඉන් පාසල් 1506 ක් ළමුන් 50 ට අඩුද තවත් 1638 ක් 50-100 අතරද වශයෙන් ළමුන් අඩුවෙන් ඉගෙනුම ලබන දුෂ්කර පාසල් වේ. එවැනි පාසල් වල තිබිය හැකි මානව සහ භෞතික පහසුකම් අල්පවීම නොවැළැක්විය හැකි කරුණකි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය ගැන යුහුසුලු වන අප වැනි සංවිධානවල මුඛ්‍ය පරමාර්ථ වන අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය (Qualitative Education) අධ්‍යාපනයේ සම අයිතිවාසිකම් (Equal rights an Education)

සැමට අධ්‍යාපනය (Education for all) වැනි සංකල්ප මෙවැනි පාසල් පද්ධතියකින් ඉටු කරගැනීමට වෙරදැරීම අතිශයින් දුෂ්කර බව මනාව ප්‍රත්‍යක්ෂ ය.

එසේනම් ඒ සඳහා කුමක් කළ යුතුද?

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් යෝජනා කරන පාසල් පද්ධති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විධිමත් ලෙස සංවිධානය කරගැනීම මගින් මේ ගැටළුව විසඳා ගැනීමට සුදුසු පියවරකි ගත හැකි යැයි අපි විශ්වාස කරමු. එසේ වුවද මේ සඳහා යම් අවස්ථාවක කථා බහ කළ ඇතැම් පාසල් වැසීම මීට සුදුසු විසඳුමක් නොවන බවද සිහිපත් කරමු. සාකච්ඡාවට භාජනයවන තවත් වැදගත් කරුණක් වනුයේ පාසල යනු ඒක රේඛීය ශිල්ප ආයතනයක් නොවන බැවින් එය බහු ශිල්පීය ආයතනයක් බවට පත්කිරීමට ක්‍රියාමාර්ග ගැනීමයි. මේ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කුමක් වුවත් මෙය ඉතාම ඵලදායි මෙන්ම අගය කළයුතු යෝජනාව කි.

දැනට අප සමාජයේ වැඩි පිරිසක් දෙමාපියන්ගේ අදහස වන්නේ තම පුතා හෝ දුව දොස්තර කෙනෙක් ඉන්ජිනේරුවෙක් හෝ ගණකාධිකාරීවරයෙක් කිරීමයි. මේ නිසා අපේ පාසලද එවැනි ශිල්පීන් බිහිකිරීමට ගැලපෙන සේ සකස්වූ ආයතන බවට පත්ව ඇත. මෙය එසේ නොවිය යුතුය.

ඊට හේතුව වන්නේ ඕනෑම රටක සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉහත සඳහන් කළ ශිල්පීන්ට අමතරව තවත් බොහෝ අංශ වලට අයත් ශිල්පීන් සිටියයුතු බැවිනි. පාසල ඒක ශිල්පීය ආයතනයක් ලෙස දිගින් දිගටම පවතිනතාක් රටේ අනෙක් අංශ බොහොමයක් මන්දගාමී තත්වට පත්වනු ඇත. නව ප්‍රතිසංස්කරණ වෙනුවෙන් අළුතින් ගුරුවරුන් 100000 ක් පුහුණු කරගත යුතු බව තවත් යෝජනාව කි.

මෙතෙක් අපේ රටේ බොහෝ ගුරුවරුන් යම් ආයතනයකින් එක් වරක් පුහුණුව ලැබීමෙන් පසු විශ්‍රාම යනතෙක්ම නැවත පුහුණුවක් නොලබයි. එසේ ලැබුවත් එය විධිමත් ව සිදුනොවේ. මේ නිසා අපේ බොහෝ ගුරුවරු කල් ඉකුත්වූ තත්ත්වයට පත්ව ඇත. තවද සෑම ගුරුවරයෙක්ම වසර 5 කට වරක් නැවත පුහුණු කළ යුතු බවටද යෝජනාවී ඇත. ඉහත කී යෝජනා දෙකම ඉතාම ඵලදායී බව කිව හැකිය. දිවයින පුරා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 40 ක් අළුතින් ඇතිකිරීමටත් ඒ අනුව සෑම දිස්ත්‍රික්කයටම පාහේ මධ්‍යස්ථාන 02ක් ලබා දීමටත් යෝජනා වී ඇත .

තවද මේවා සම්ප්‍රදායික කාර්මික විද්‍යාල වලට වඩා වෙනස්වූ සැබෑ වෘත්තිකයන් බිහිකරන ආයතනය බවට පත් කෙරෙන බවද යෝජනා වී ඇත. ඉහළ අධ්‍යාපනයට හෝ රැකියා අවස්ථාවකට යොමු නොවී දහතුන වසරෙන් පාසල හැරයාමට ඉඩනොදී රඳවා තබා ගැනීමට මෙන්ම ඉහළ වෘත්තියකට යොමු කිරීම සඳහා මෙම වෘත්තීය ආයතනයට හැකිවන බව මේ සම්බන්ධව අදහස් ඉදිරිපත්වී තිබේ.


අතීතයේ ද මෙවැනි අරමුණු රැගත් ආයතන බිහිව තිබුණ නමුත් ඒවායින් උපරිම ප්‍රතිඵල ලැබුවාදැයි පසු විපරමක් හෝ නැත. එබැවින් මෙම උත්සාහය මල්ඵල ගැන්වීමට හැකි වේවායි සුභ පතමි.

**අධ්‍යාපනපති,**

**ඩබ්. විජේවන්ත වෙල්ලාල**

# මේ සාහිත්‍ය මාසයයි.

සෑම වසරකම සැප්තැම්බර් මාසය එළඹෙනුයේ "සාහිත්‍ය" යන නමත් සමගය. ඒ වසරේ සෑම සැප්තැම්බරයක්ම සාහිත්‍ය වෙනුවෙන් වෙන් කර තිබීම නිසාය. සාහිත්‍යය වෙනුවෙන් වෙනම මාසයක් වෙන් කිරීමට අවශ්‍ය ද යන්න පිළිබඳ විචාරකයින් අතර කුමන මතවාද තිබුණත් වර්තමානයේ එය මහත් උත්සවශ්‍රීයෙන් සමරනු ලබයි. ශ්‍රී ලංකාවේ  සාහිත්‍ය මාසය ගැන කතා කරන විට අපට සිහි වනුයේ පොත් ප්‍රදර්ශනයයි. පොත් කියවීමට හා ලිවීමට කැමති සියල්ලන්ටම විවෘත වන පොත් ප්‍රදර්ශනය මේ වසරේත් උත්කර්ෂයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දින කිහිපයක් පුරා පැවැත්වේ. එක් අතකට එක තැනකින් අවශ්‍ය පොත් පත් මිලදී ගැනීමට මෙවැනි ප්‍රදර්ශන තිබීමත් පාඨකයින්ට පහසුය.




සාහිත්‍ය මාසය යනු පොත් ප්‍රදර්ශනය පමණක් නොව ඊට එහා ගිය පුළුල් පරාසයක විහිදුණු වැඩකටයුතු රැසක් සිදුවන මාසයකි. හොඳම පොත් ප්‍රකාශකයින්, කර්තෘවරු, වසරේ හොඳම කෙටි කතා සංග්‍රහය, වසරේ හොඳම නවකතාව යනාදී  වශයෙන් සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් කැපවෙන විද්වතුන්ට සම්මාන ලබා දීමත්, විවිධ කර්තෘ හා පාඨක සුහද හමු පැවැත්වීම, සාහිත්‍යමය සාකච්ඡා මණ්ඩප, සිනමා ප්‍රදර්ශන හා විචාරක වැඩසටහන්, සාහිත්‍ය තරග පැවැත්වීම යනාදිය මීට නිදසුන් වේ. මේ කාලය වන විට ලංකාවේ විශ්වවිද්‍යාලවල, පාසල්වල සාහිත්‍ය උත්සව, ඔන්ලයින් සාකච්ඡා,වේදිකා නාට්‍ය පෙන්වීම වැනි කලාත්මක මුහුණුවර ගත් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වනු දැකිය හැකිය.

## මූල්‍ය ක්‍රියා පිළිවෙල  සහ කළමනාකරණය පිළිබඳ ධාරිතා වැඩසටහන

අධ්‍යාපන සංවර්ධනය සන්ධානය (CED) විසින් මූල්‍ය ක්‍රියා පිළිවෙල  සහ කළමනාකරණය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවක් 2025 අගෝස්තු මස, ජානකී හෝටලයේදී සාමාජික සංවිධාන මූල්‍ය නියෝජිතයන් සඳහා පැවැත්විය. CED හි මූල්‍ය සම්බන්ධීකාරක ප්‍රභාගර් මහතා මූල්‍ය පාලන ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් ලබා දුන් අතර, CED හි භාණ්ඩාගාරික චමින්ද පියසේකර මහතා සාමාජික සංවිධාන තුළ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් බෙදා ගන්නා ලදී.




## මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන්  පිටුවක්....

ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,
අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්තාවන් අපට කියන්න. මීලග හඩ සඟරාව සඳහා ඔබේ නිර්මාණ 2025 ඔක්තෝම්බර් 20 ට පෙර lakmalicedsrilanka@gmail.com මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12

ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12




අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය
web: cedsrilanka.org
දුරකතනය : 0112887642